# නිර්මාණකරණ ක්‍රියාවලියේ දාර්ශණික පසුබිම

නිර්මාණකරණය හා තාක්ෂණවේදය විෂයේ දී ගැටලු විසඳීම සඳහා නිර්මාණකරණ ක්‍රියාවලිය උපයෝගී කරගනී. එ නම් යම් යම් ගැටලු වලට විසඳුම් සොයන ආකාරයත් තම අදහස් නිසි ලෙස මෙහෙයවීම තුළින් සාර්ථක නිමැවුම් කරුවෙකු බිහි කිරීම මෙහි අරමුණයි.

ලංකා ඉතිහාසය පිරික්සීමේ දී එදා අප මුතුන් මිත්තන් කළ නිර්මාණයන් අදටත් ලක්වැසියන්ට මහත් අභිමානයක් ප්‍රෞඪත්වයක් එකතු කරයි. ඉතිහාසගත තොරතුරු අනුව ලොව පළමු ගුවන් යානය රාවණ රජුගේ දඬුමොණරයයි. එසේම රජ රට ඇති වැව් අමුණු වල දක්නට ලැබෙන වාරි තාක්ෂණික ශිල්පීය ක්‍රම, වෙහෙර විහාර වැනි ස්ථානවල දක්නය ලැබෙන සුවිශේෂී නිර්මාණ ලොව පුදුම කරවනු නොඅනුමානය. සීගිරිය, ඇම්බැක්ක දේවාලය ලී කැටයම්, ජේතවනාරාමය, රුවන්වැලිසෑය වැනි නිර්මාණයන් පුදුම කරවන නිර්මාණයන් ය. එදා පැවති ලෝහ කර්මාන්තයන් ද තාක්ෂණික ඥානය විදහා පාන අවස්ථාවන් ය.

අද වන විට විවිධ ශිල්පී ඥානය උපයෝගී කරගනිමින් මිනිසා සඳ මත පා තබන්නට විය. මෙවන් නිර්මාණයන් බිහි කිරීමට අවශ්‍ය තාක්ෂණික ඥානය විවර කරලීම නිර්මාණකරණය ක්‍රියාවලියෙන් ඉඩ සැලසෙනු ඇත.

පවතින පහසුකම් අවම කර ගැනීමෙන් සහ පහසුකම් වර්ධනය කරගැනීමෙන් ඵලදායීතාව වැඩි කරගැනීමට කළ යුතු වඩාත් ගැලපෙන වෙනස්කම් පිළිබඳ අදහස් යම් අයෙකු තුළ ඇතිවේ නම්, එවැනි අදහ නිර්මාණශීලි අදහස් ලෙස ද එවැනි පුද්ගලයන් නිර්මාණශීලී පුද්ගලයන් ලෙස ද අර්ථ දැක්විය හැකිය.

- සෑම පුද්ගලයෙකුටම නිර්මාණශීලි හැඟීම් හා අදහස් ඇත. එම අදහ නිර්මාණකරණ ක්‍රියාවලිය මත හසුරුවා ගැනීමෙන් ඔබට ද සාර්ථක නිර්මාණකරුවෙකු විය හැකිය.
- සෑම භාණ්ඩයක් මෙන් ම උපකරණයක් සැලසුම් කර නිපදවනු ලබන්නේ අවශ්‍යතා පදනම් කරගෙනය. අවශ්‍යතා මත කරනු ලබන නිපැයුම් වල වැදගත්කම හා ඉල්ලුමේ ප්‍රබලතාවය මත ඒවායේ පහසුකම් හා වැඩි දියුණු කිරීම වේගවත් වේ.

උදා:- I

සාම්ප්‍රදායික හිරමණයක කාර්යක්ෂමතාව මදි වූ පුද්ගලයන් මේසය මත සවිකරණ හිරමණය නිපදවූවා විය හැකිය.පසුව කාර්යක්ෂමතාව තවත් වැඩි කර ගැනීම සඳහා මෝටරයක් යොදා ගෙන එම කාර්යය තවත් පහසු කර ගන්නා ලදී.

උදා :-

නිශ්චිත ස්ථානයක නොසිටින පුද්ගලයෙකුට පණිවුඩ ලබා දී මේ ගැටලුවට විසඳුම් සෙවූ පිරිසක් ජංගම දුරකථන සංවර්ධනය කරගැනීම.

*අන්තර්ගතය : Y.D.N.P. විමලසිරි මයා*
*සැකසුම : S.S.කෝරලේගෙදර මෙනවිය - රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය*

ලොව සෑම දාර්ශනිකයෙකුම තමාගේ නිර්මාණ සාර්ථක කර ගැනීම සඳහා යම් ක්‍රියා පටිපාටියක් අනුගමනය කර ඇත. එනම් එය නිර්මාණයක් කිරීමේ ක්‍රියාවලියයි.

## <u>නිර්මාණකරණ ක්‍රියාවලිය</u>




*අන්තර්ගතය : Y.D.N.P. විමලසිරි මයා*
*සැකසුම : S.S.කෝරලේගෙදර මෙනවිය - රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය*

## ගැටළුව/ගැටළුමය අවස්ථා හඳුනා ගැනීම

බොහෝ විට තම සිත තුල තමාගේ ලැදියාවක් නිසා හෝ විනෝදය නිසා ඇති වූ ක්‍රියාකරකමක් හෝ යම් පහසුකම් නොමැතිකම නිසාඇති වූ අපහසුතාවයක් හෝ නිවස, පාසල, ව්‍යාපාරික ස්ථානය ආශ්‍රිත ගැටළුවක් හෝ අවශ්‍යතාවයක් ගැටළුවක් ලෙස අපට ගත හැකිය.

හඳුනාගත් ගැටළුව → නිවස අවට පරිසරය අලංකාරවත් නොවීම

## ගැටළුව විශ්ලේෂණය කිරීම

ගැටළුමය අවස්ථාව තමාගේම ගැටළුවක් ලෙස සලකා ඒ පිළිබඳව කරුණු අධ්‍යයනයක යෙදීමෙන් ගැටළුව විශ්ලේෂණය කර එහි යථා තත්වය අවබෝධ කරගත යුතුය. මේ සඳහා,

- ගැටළුවකට මුහුණ දුන් අයගෙන් අදාල තොරතුරු විමසීම
- ගැටළුව පිළිබඳ පුළුල් නිරීක්ෂණයක යෙදීම
- භාණ්ඩයක් පිළිබඳව නම් එහි කොටස් ගැන විශ්ලේෂණාත්මක ව දත්ත, තොරතුරු රැස් කිරීම කළ යුතුය.

ගැටළුව විශ්ලේෂණය කිරීමේ දී,

- අදාල තොරතුරු පමණක් භාවිතයට ගත යුතුය
- පුළුල් ව ගැටළුවට අදාල නිධානය පිළිබඳව සොයාබැලීම
- ගවේෂණාත්මකව තොරතුරු මත ගැටළුව පැහැදිලි කර ගැනීම.

ගැටළුව විශ්ලේෂණය → ප්‍රියමනාප නොවන දර්ශන අක්‍රමවත් හැඩතල සහිත භූමිය ජලවහනය දුර්වල වීම අනවශ්‍ය ශාක හා ගොඩනැගිලි | නිරීක්ෂණ ක්‍රියා

## නිර්මාණ විශ්ලේෂණය

ගැටළුව විශ්ලේෂණයෙන් පසුව, එළඹෙන විසඳුම පිළිබඳ ව කෙටි ලිඛිත සටහනක් සකස් කිරීම මෙයින් අදහස් වේ.

- ඉදිරිපත් කරන අවසන් ඵලය කුමක්ද යන්න නිශ්චිතව මෙයින් ප්‍රකාශ නොවිය යුතුය.

මෙහි දී කරන දේ පිළිබඳව කෙටියෙන් හැඳින්වීමක් කරනු ලැබේ.

නිර්මාණ සාරාංශය →

නිවස පැහැදිලි ව දර්ශණය වන ඇසට ප්‍රියමනාප පෙනුමක් සහ ශරීරයට සිසිලක් ලබාදෙන අතර පරිසර සංරක්ෂණය ද සිදුවන විනෝද වීමට ඉඩකඩක් සමඟ ආර්ථික වාසිය ලබාදෙන භූමියක් සැලසුම් කර සකස් කරයි.

## දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය

නිර්මාණ සාරාංශයෙන් පසුව එම නිර්මාණයන් පිළිබඳව දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය කළ යුතුය. ඒ සඳහා,

- සමීක්ෂණ
- ක්ෂේත්‍ර චාරිකා
- ගවේෂණ කළ යුතුය.

උදා :-

විවිධ ගෙළයන් නැරඹීම

පොත්පත් පරිශීලණය

සාකච්ඡා මගින්

ස්ථාන නිරීක්ෂණ

The National e-learning Portal for The General Education

*අන්තර්ගතය : Y.D.N.P. විමලසිරි මයා*
*සැකසුම : S.S.කෝරලේගෙදර මෙනවිය - රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය*

## <u>පිරිවිතර ගොඩනැගීම</u>

නිර්මාණය සඳහා අදාළ පිරිවිතර ගොඩනැගීම මූලික කරුණු ගවේෂණයෙන් පසුව හා අවස්ථා විශ්ලේෂණයෙන් පසුව සිදු කළ යුතුය.

පිරිවිතර ගොඩනැගීමට ප්‍රථමයෙන් සලකා බැලිය යුතු මූලික කරුණු කීපයකි.

- නිමැවුම භාවිතයට ගන්නේ කවුරුන් විසින්ද?
- නිමැවුම භාවිතයට ගන්නේ කොහේදී ද?
- නිමැවුම භාවිතයට ගන්නේ කෙසේ ද?
- නිමැවුම නිෂ්පාදනය සඳහා වඩාත් සුදුසු අමුද්‍රව්‍ය මොනවාද?
- කෘතියේ ක්‍රියාකාරීත්වය කෙබඳු විය යුතු ද?
- මානව ගතික ස්වභාවයන්ට ගැළපේ ද?
- සෞන්දර්යාත්මක වටිනාකම කෙබඳු විය යුතු ද?
  (වර්ණය හා වයනය, ප්‍රමාණය, හඩය, සමතුලිතබව)
- ගුණාත්මක බව කෙසේ විය යුතු ද?
- නිමැවුමේ ඵලදායීතාව ප්‍රමාණවත් වේද?
- ආරක්ෂාකාරී තත්වයක් පවතී ද?
- භාවිතයේ දී එය නඩත්තු කිරීම කළ හැකි ද?

ඉහත පිරිවිතර සියල්ල සමඟ ගැලපෙන විසඳුම අදාළ නිෂ්පාදනයට යෝග්‍ය වේ.

පිරිවිතර →

- නිවස මූලිකව තිබිය යුතුය.
- අලංකාර දර්ශනයක් ලැබිය යුතුය.
- පරිසර සංරක්ෂණය විය යුතුය.
- අපතේ යන ද්‍රව්‍ය වලින් ප්‍රයෝජන ගත හැකි විය යුතුය.
- පස සංරක්ෂණය විය යුතුය.
- නඩත්තු කටයුතු පහසුවිය යුතුය.
- වියදම උපරිම වශයෙන් රු...... විය යුතුය.

*අන්තර්ගතය : Y.D.N.P. විමලසිරි මයා*
*සැකසුම : S.S.කෝරලේගෙදර මෙනවිය - රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය*

The National e-learning Portal for The General Education

## විසඳුම් සහ යෝජනා

මේ සඳහා විසඳුම් කීපයක් ඉදිරිපත් ව තිබිය යුතුය. එම විසඳුම් එකිනෙක පිරිවිතර සමඟ ගළපමින් වඩාත් උචිත විසඳුම තෝරාගත යුතුය. තමා නිරීක්ෂණය, ගවේෂණය තුළින් ගත් අත්දැකීම් ද මේ සඳහා උපයෝගී කරගෙන සාර්ථක විසඳුමක් ලබා ගත යුතුය.

විසඳුම් සහ යෝජනා →

1. භූමිය සම්පූර්ණයෙන් සමතලා කර ශාක හා විවිධ නිර්මාණ යොදා ගැනීම
2. භූමියේ හැඩය හා ස්වභාවය අනුව අනවශ්‍ය අංග ඉවත් කර නව නිර්මාණ ඇති කිරීම.
3. සියළු දේ පිටතින් රැගෙන විත් සවි කිරීම.

## වඩා උචිත විසඳුම

ගැටළුව සඳහා සුදුසු විසඳුම් යෝජනාකිරීමේ දී විශ්ලේෂණාත්මක තොරතුරු, නිර්මාණාත්මක සිතිවිලි, දළ සටහන් ආකෘති ආදිය හා තමා තුළ ඇති කුසලතවාන් ගැන ද අවධානය යොමු කළ යුතුය. ව්‍යාපෘති කිරීමේ දී පිළිගත් යෝජනාව හා ඊට හේතු ද, අනෙකුත් යෝජනා ප්‍රතික්ෂේප වීමට හේතු ද ඉදිරිපත් කළ යුතුය.

උචිත විසඳුම → භූමියේ හැඩය හා ස්වභාවය අනුව අනවශ්‍ය අංග ඉවත් කර නව නිර්මාණ ඇති කිරීම

*අන්තර්ගතය : Y.D.N.P. විමලසිරි මයා*
*සැකසුම : S.S.කෝරලේගෙදර මෙනවිය - රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය*

*පිළිගත් යෝජනා හා ඊට හේතු*

➢ අංක 02 විසඳුම ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගැනිණ.
හේතු :

- පිරිවිතර අනුව ගැලපීම
- අවශ්‍යතාවය අනුව පහසුවෙන් සකසා ගත හකි වීම
- දැකුම්කළු ස්වභාවයක් ගැනීම
- නිර්මාණාත්මක බවක් ප්‍රකාශ වීම

*අනෙකුත් යෝජනා ප්‍රතික්ෂේප වීමට හේතු*

- පිරිවිතර එකක් හෝ කීපයක් සමඟ නොගැලපීම

## කාර්‍ය චිත්‍ර හා සැළසුම් සටහන් ඇඳීම

මෙහි දී කාර්‍ය චිත්‍ර හා සැලසුම් මෙන්ම ඇස්තමේන්තු සැකැස්ම පිළිබඳ ව අවබෝධයක් ලැබේ. මේවා ව්‍යාපෘති වාර්තාව සකසීමේ දී අවශ්‍ය වේ.

*කාර්‍ය චිත්‍ර වල ඇතුළත් විය යුතු අංග*

| | | |
|---|---|---|
| ඒ ඒ කොටස් සඳහා මිමි දක්වන දළ රූපසටහන් | අමු ද්‍රව්‍ය හා ඒවායේ ප්‍රමාණ ගණනය කිරීම | නිමහම් කිරීමේ ක්‍රම පිළිබඳ ව සටහන් විය යුතුය. |

කාර්‍ය චිත්‍ර හා රූප සටහන් →

- භූමියේ ඇගයුම් සැලැස්ම ඇඳීම.
- භූමියේ සැකසූ පසු දර්ශණ ඇඳීම
- කාල රාමුව සැකසීම
- සැලැස්ම නිර්මාණයකට ඇඳීම

*අන්තර්ගතය : Y.D.N.P. විමලසිරි මයා*
*සැකසුම : S.S.කෝරලේගෙදර මෙනවිය - රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය*

*හඳුනාගත් ගැටළුවකට සැලසුම් සටහන් සැකසීමේ දී*

- වෙළඳ පොළ සමීක්ෂණ
- ප්‍රායෝගික භාවිතය
- නිර්මාණය සඳහා සුදුසු අමුද්‍රව්‍ය
- නිර්මාණය ගොඩනැගීම
- නිමැවුම මගින් ඇතිවන සමාජ හා පාරිසරික බලපෑම පිළිබඳව සළකා බැලිය යුතුය.

## ආකෘති අත්හදා බැලීම

ආකෘතිය තුළ බලාපොරොත්තු වන නිර්මාණයේ සියලු අංගෝපාංග ඇතුලත් වීමත්, ක්‍රියාකාරීත්වයත්, පරිමාණානුකූල වීමත් ඉටුවිය යුතුය. අනුරූප ආකෘතියක් සැකසීම සඳහා විවිධ කුසලතා ඇතුළත් ක්‍රියාකාරකම් වල යෙදීමට සිදුවේ. මේ මගින් තමාගේ කුසලතා තවත් දියුණු වේ.

යම් කාර්යයක් අවශ්‍ය පිරිවිතරයන්ට අනුව සිදු නොවේ නම්, ගටලුව විසඳීමේ ක්‍රමයේ වෙනස්කම් සිදුකිරීමට සිදු වනු ඇත.




➢ නිර්මාණයට අදාළ ආකෘතිය අදාල ගැටලුව විසඳීමට ක්‍රියාත්මක කළ හැකිදැයි සෑම පියවරක දී ම ඇගයීමට ලක් කළ යුතුය.

## විසඳුම් යෝග්‍යතාව පරීක්ෂා කිරීම හා ඇගයීම

- නිපැයුම් ක්‍රියාවලියේ දී හඳුනාගත් ප්‍රබලතා - දුබලතා හා විශේෂ අවස්ථා ආදිය සටහන් කරගත යුතුය.
- ඔබගේ නිපයුමේ දුර්වලතා ඇත්නම් ඒවාට හේතු සොයා බලන්න
- තමාගේ නිර්මාණය පිළිබඳ අන් අයගේ විවේචන වලට සවන් දෙන්න

- තමාගේ නිර්මාණය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

විසඳුම් යෝග්‍යතාව පරීක්ෂා කිරීම හා ඇගයීම

→

දර්ශණීය පෙනුමක් ලැබේ ද?

පාරවල්, පත්ති හා නිර්මාණ නියමිත පරිදි පිහිටුවා තිබේ ද?

↓

සැලසුම් ක්‍රියාත්මක කිරීම

බිම් සැකසීම

රෝපණ ද්‍රව්‍ය සිටුවීම

නඩත්තුව

## <u>ව්‍යාපෘති වාර්තාව</u>

ව්‍යාපෘති වාර්තාව තුළින් සිදුකරනු ලබන්නේ ගැටළුව හඳුනා ගැනීමේ සිට විසඳුම් ක්‍රියාත්මක කිරීම දක්වා සියලු පියවර ඇතුළත් වාර්තාවක් සකස් කිරීමෙන් ඇගයීමේ ක්‍රියාවලිය පහසු කරලීමයි

ව්‍යාපෘති වාර්තාව →

- මාතෘකාව
- පටුන
- ක්‍රියාවලිය ආදී වශයෙන්

*අන්තර්ගතය : Y.D.N.P. විමලසිරි මයා*
*සැකසුම : S.S.කෝරලේගෙදර මෙනවිය - රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය*

උදා :-







*අන්තර්ගතය : Y.D.N.P. විමලසිරි මයා*
*සැකසුම : S.S.කෝරලේගෙදර මෙනවිය - රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය*

නිර්මාණකරණ ක්‍රියාවලිය සරල රේඛීය පියවර නොවන අතර එය චක්‍රයක් ලෙස ගමන් කරයි. ඒත් පියවරක සිට ආපසු ඕනෑම පියවරකට ගමන් කර එතැන් සිට නිවැරදි කරගෙන පැමිණිය හැකිය.